# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 11,654—1959 ජනවාරි 28 වැනි බදාදා—28.1.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**සී 283 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **එළුමස්.**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මිළ (ආහාර) පාලක තැන්පත් කොටුවේ මුහන්දිරම් ධර්මසේන ජයනෙත්ති වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිළ (ආහාර) පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1958 මැයි මස 31 වෙනි දිනය හා 11,332 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 මැයි 31 වෙනි දිනය හා සී 270 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති උප ලේඛනයේ 2, 3, සහ 4 වෙනි තීරයන්හි සඳහන් මිළ, එළුමස් රාත්තලක වැඩිම මිළ වශයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස්, එම උප ලේඛනයේම 1 වෙනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශය තුළ එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) '' එළුමස් '' යනුවෙන් හැඟවෙන්නේ බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ මාංශයයි. බොකු බඩවැල් ආදී සියළු ආකාර ඉවත් කරණු ලබන දය මීට ඇතුළත් නොවේ.

(ආ) බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ සිරුර විකිණීම සඳහා මස් මඩුවේ පිළියෙළ කොට ඇති පරිදි (එනම්: හිස, හම, බොකු, බඩවැල්, කුර සහ වෙනත් සියළු විධියේ සාමාන්‍යයෙන් ඉවත් කරණු ලබන දය අතහැර) විකුණන විට '' තනි බර අනුව '' විකිණීමක් ලෙස සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) කටු සහිත එළුමස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට 25 කට වඩා කටුවල බර වැඩි නොවිය යුතු යි.

(v) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසියම් තැනක වාහනයක හෝ යාත්‍රාවක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ, උප ලේඛනයෙහි සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිමිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් එකී ස්ථානයේ, වාහනයේ හෝ යාත්‍රාවේ පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුය.

(vi) ඉවත් කරණු ලබන දය සමග එළුමස් එකම ගණුදෙනුවකදී විකුණනු ලබන විට එළුමස්, ඉවත් කරණු ලබන දයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(vii) සෑම වෙළෙන්දෙකුම එළුමස් විකුණන කල්හි, එළුමස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකි වන සේ බර කිරණ තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(viii) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් විකුණන සෑම වෙළෙන්දෙකුම, එළුමස් ලබාගන්නෙකු ඉල්ලා සිටිය විට කුයිතාන්සියක් දිය යුතුයි. එම කුයිතාන්සියේ—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ එළුමස් ප්‍රමාණය (බර) ;
(ඇ) විකුණූ එළුමස්වල විස්තරය සහ
(ඈ) විකුණූ මස් ප්‍රමාණයට ගෙවූ මුදල ද, සඳහන් විය යුතුයි.

(ix) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළ, කිසිවෙකු උපලේඛනයේ සඳහන් දය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කළවම් කොට නොවිකිණිය යුතුයි.

(x) උප ලේඛනයෙහි සඳහන් දය විකුණන කල්හි, එකී දය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිලක් වෙතොත් එය එම උපලේඛනයෙහි 2, 3, සහ 4 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගතවේ.

(xi) මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් '' රා. '' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1959 ජනවාරි 28 වෙනි දින පෙරවරු 9 ට කොළඹ දී අත්සන් කරන ලදී.

ධර්මසේන ජයනෙත්ති,
මිළ (ආහාර) පාලක.


289—**ජේ. ඇන්. ආර්** 152—3,950 (1/59)

උපලේඛනය

**එළුමස් සඳහා වැඩිම මිල**

| 1වෙනි තීරය<br>ප්‍රදේශ | 2 වෙනි තීරය<br>එළුමස්<br>(කටු රහිත)<br>රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>එළුමස්<br>(කටු සහිත)<br>රාත්තලක වැඩි මිළ<br>රු. ශ. | 4වෙනි තීරය<br>එළුමස්<br>(තනිබර අනුව)<br>රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| කොළඹ නාගරික ප්‍රදේශය ... ... | 2 25 ... | 1 95 ... | 1 70 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී